ENVIRONMENTAL BIOLOGY

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ ජීව විද්‍යාව

# ඒකකය 08 පාරිසරික ජීව විද්‍යාව

විෂයය නිර්දේශය ආවරණය කිරීමේ මඟ පෙන්වීම


**මාවනැල්ල අධ්‍යාපන කලාපය**

ගෞරි අනුපමා විජේසිංහ.

කෑ/මාව/ පින්නවල මධ්‍ය මහා විද්‍යාලය

# පරිසරය හා එහි ව්‍යුහය

**1 කොටස - (නිපුණතා මට්ටම: 8.2.1)**

**01.** පරිසරය යනු කුමක්ද?

**02.** පාරිසරික සංවිධානයේ මට්ටම් මොනවාද?

**03.** ඉහත එක් එක් මට්ටම හඳුන්වා දෙන්න.

**04.** පරිසරයේ පවතින සංරචක වර්ග කෙරෙන ප්‍රධාන කාණ්ඩ 2 මොනවාද? එම කාණ්ඩවලට උදාහරණ දෙන්න.

**05.** පහත පද අර්ථ දක්වන්න.

**a.** නිකේතනය **b.** වාසස්ථානය

## පරිසරයේ ජෛව හා අජෛව සංරචක අතර අන්තර් ක්‍රියා

**06.** පරිසර පද්ධතියක් තුල පවතින අන්තර් ක්‍රියා ආකාර 2 මොනවාද? ඒවාට උදාහරණ ලබා දෙන්න.

**07.** පෘථිවියේ ප්‍රධාන ශක්ති ප්‍රභවය වන්නේ කුමක්ද?

**08.** සියලු ශාක ශක්තිය ලබා ගන්නා ප්‍රභවය කුමක්ද?

**09.** සියලු සත්ත්වයින් ශක්තිය ලබා ගන්නේ කවර ශක්ති ආකාරයක් ලෙසද?

**10.** පෝෂී මට්ටමක් යනු කුමක්ද?

**11.** ඕනෑම පරිසර පද්ධතියක් තුළ හමුවන පළමු පෝෂී මට්ටමෙන් නිරූපණය වන්නේ කවුරුන්ද?

GAURI ANUPAMA

**12.** ආහාර දාමයක් යනු කුමක්ද?

**13.** දර්ශීය ආහාර දාමයක හමුවන කොටස් මොනවාද?

**14.** ප්‍රාථමික නිශ්පාදනය යනු කුමක්ද?

**15.** ප්‍රාථමික නිශ්පාදකයින්ට උදාහරණ දෙන්න.

**16.** පහත පද හඳුන්වන්න.

**a.** ප්‍රාථමික පරිභෝජකයා **b.** ද්විතියික පරිභෝජකයා **c.** තෘතියික පරිභෝජකයා

**17.** සරල ආහාර දාම 2ක් වචන හා රූතල සටහන් ලෙස ලියා දක්වන්න.

**18.** ආහාර ජාලයක් යනු කුමක්ද?

**19.** ආහාර දාමයක පෝෂී මට්ටම් සංඛ්‍යාව 4කට හෝ 5කට සීමා වීමට හේතුව පැහැදිලි කරන්න.

**20.** කෙටි ආහාර දාම , දිග ආහාර දාමවලට වඩා වඩාත්ම පාරිසරිකව කාර්යක්ෂම වන්නේ ඇයි?

**21.** පාරිසරික පිරමීඩ පිළිබඳව සංකල්පය ගොඩනැගුවේ කවුද?

**22.** පාරිසරික පිරමීඩ මඟින් දක්වන්නේ කවරක් පිළිබඳවද?

**23.** පාරිසරික පිරමීඩ ආකාර 3 නම් කරන්න.

**24.** එම පිරමීඩ වර්ග හඳුන්වා ඒවායේ ලක්ෂණ වෙන වෙනම සඳහන් කර ඒවාට උදාහරණ ලබා දෙන්න.

**25.** පාරිසරික පිරමීඩ ආකාර ඇඳ, ඒවායේ එක් එක් මට්ටම නම් කරන්න.

GAURI ANUPAMA

## සටහන

→ පරිසර පද්ධතියක් තුල ශක්තිය ගලා යාම පෙන්වන ආහාර දාමයක සෑම පියවරක්ම "පෝෂී මට්ටමක්" ලෙස සලකයි.

→ ඒ අනුව,

- පළමු පෝෂී මට්ටම ලෙස " ප්‍රාථමික නිශ්පාදකයින්",
- දෙවන පෝෂී මට්ටම ලෙස "ප්‍රාථමික පරිභෝජිකයින්",
- තෙවන පෝෂී මට්ටම ලෙස "ද්විතියික පරිභෝජිකයින්",
- සිවුවන පෝෂී මට්ටම ලෙස "ප්‍රාථමික මාංශ භක්ෂකයින් මත යැපෙන "ද්විතියික මාංශභක්ෂකයින්" හෙවත් "තෘතීයික පරිභෝජිකයින්" දැක්විය හැක.

→ සමහර ජීවීන් විවිධ ආහාර දාම වලදී එකිනෙකට වෙනස් පෝෂී මට්ටම් නියෝජනය කරයි.

→ උදා:

වී → කුකුළා → නරියා

ඉහත ආහාර දාමයෙහි කුකුළා දෙවන පෝෂී මට්ටමට අයත් වුවත් පහත ආහාර දාමයෙහිදී, කුකුළා සිටින්නේ තුන්වන පෝෂී මට්ටමෙහිය.

ශාක මුල් → පනුවා → කුකුළා → නරියා

→ ආහාර දාමයක් පෝෂී මට්ටම් හතරකට හෝ පහකට සීමා වේ.

→ කෙටි ආහාර දාමවල ඉහළම පෝෂී මට්ටමේ වුවද, දිගු ආහාර දාම වලට වඩා වැඩි ප්‍රයෝජ්‍ය ශක්තියක් ඇත.

→ ස්වාභාවික පරිසරයේ බොහෝ විට ආහාර දාම වෙන් වෙන් වශයෙන් නොපවතී. ඒවා අන්තර් සම්බන්ධ වීමෙන් සෑදුනු ආහාර ජාල ලෙස පවතී.

→ ආහාර දාමයක් ඔස්සේ ශක්ති ගලනය සෑමවිටම ඒක දිශානතව සිදුවේ.

GAURI ANUPAMA

# ගෝලීය හා දේශීය ජීව පරිසර සංඝටකවල විෂමජාතීය ස්වභාවය

## ලෝකයේ ප්‍රධාන බියෝම

**2කොටස - (නිපුණතා මට්ටම: 8.2.1)**

**26.** බියෝමය අර්ථ දක්වන්න.

**27.** යම් ප්‍රදේශයක කුමන ආකාරයක බියෝමයක් පැවතිය හැකිද යන්න තීරණය වන ප්‍රධාන සාධක මොනවාද?

**28.** ලෝකයේ ප්‍රධාන භෞමික බියෝම නම් කරන්න.

**29.** පහත ප්‍රස්ථාරයෙහි ඔබ නම් කල බියෝම ලකුණු කර පෙන්වන්න.

ANUPAMA



**30.** නිවර්තන වනාන්තර ආකාර 2 මොනවාද?

**31.** එම වනාන්තර ආකාර 2 අතර පවතින වෙනස් කම් මොනවාද?

**32.** නිවර්තන වනාන්තර විනාශ වී යාමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ කවරක්ද?

**33.** ඔබ ඉහත නම් කළ, ලෝකයේ ප්‍රධාන බියෝම වර්ග 8 පිළිබඳව පහත තොරතුරු සපයන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| බියෝමය | | | | | | | | |
| ව්‍යාප්තිය | | | | | | | | |
| උදාහරණ | | | | | | | | |
| වාර්ෂික වර්ෂාපතනය | | | | | | | | |
| උෂ්ණත්වය | | | | | | | | |
| විශේෂ දේශගුණික ලක්ෂණ | | | | | | | | |
| වෘක්ෂලතා හා ඒවායේ ස්වාභාවය | | | | | | | | |
| සතුන් හා ඔවුන්ගේ ලක්ෂණ | | | | | | | | |
| මිනිසාගේ බලපෑම | | | | | | | | |

GAURI ANUPAMA

## සටහන

නිවර්තන වර්ෂා වනාන්තර

සෞම්‍ය කලාපීය පළල් පත්‍ර දරන වනාන්තර



කේතුධර වනාන්තර

තුන්ද්‍රා

කාන්තාර

සැවානා

සෞම්‍ය කලාපික තණ බිම්

චපරාල්

→ ලෝකයේ ප්‍රධාන භෞමික බියෝම

- නිවර්තන වනාන්තර
- සවානා
- කාන්තාර
- චපරාල්
- සෞම්‍ය කලාපීය තණබිම්
- සෞම්‍ය කලාපීය පළල් පත්‍ර දරන වනාන්තර
- උතුරු කේතුධර වනාන්තර
- තුන්ද්‍රා

→ මෙම එක් එක් බියෝමය පරිසර පද්ධති ගණනාවකින් සමන්විත වේ. එකම බියෝමය තුළ දේශගුණික වශයෙන්, භූ ලක්ෂණ හා පසේ තත්ත්වයන් මත ඇතිවන සුලු සුලු වෙනස්කම් නිසා මෙවැනි පරිසර පද්ධති බිහිවේ.

GAURI ANUPAMA

# ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති

**34.** ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම සඳහන් කරන්න.

**35.** ශ්‍රී ලංකාව තුළ වඩාත් විවිධත්වයෙන් යුත් භෞමික සහ ජලජ පද්ධති පිහිටීමට හේතු කවරේද?

**36.** ශ්‍රී ලංකාවේ පවතින පරිසර පද්ධති වර්ගීකරණය කළ හැකි ප්‍රධාන කාණ්ඩ 3 මොනවාද?

**37.** එම එක් එක් පරිසර පද්ධති කාණ්ඩය යටතට අයත් වන එකිනෙකට වෙනස් පරිසර පද්ධති ආකාර සඳහන් කරන්න.

**38.** දේශගුණික කලාප පදනමින් ශ්‍රී ලංකාවේ පවතින පරිසර පද්ධති වර්ගීකරණය කළ විට, පහත සඳහන් දේශගුණික කලාපවලට අයත්වන පරිසර පද්ධති ආකාර නම් කරන්න.

| දේශගුණික කලාපය | වනාන්තර | තෘණ භූමි | වෙනත් |
|---|---|---|---|
| ශුෂ්ක කලාපය | | | |
| වියළි කලාපය | | | |
| අතරමැදි කලාපය | | | |
| තෙත් කලාපය | | | |

GAURI ANUPAMA

**39.** ශ්‍රී ලංකාවේ භෞමික පරිසර පද්ධති යටතට අයත් වන වනාන්තර පිළිබඳව පහත තොරතුරු සපයන්න.

| | | | | |
|---|---|---|---|---|
| වනාන්තර ආකාරය | | | | |
| ව්‍යාප්තිය | | | | |
| උදාහරණ | | | | |
| වර්ෂාපතනය | | | | |
| උෂ්ණත්වය | | | | |
| වෘක්ෂලතා වල ස්වභාවය | | | | |
| ශාක විශේෂ | | | | |
| සත්ත්ව විශේෂ | | | | |
| මානව බලපෑම් | | | | |

**39.** ශ්‍රී ලංකාවේ සැවානා තණ බිම් ව්‍යාප්තව ඇති ප්‍රදේශ මොනවාද?

**40.** මෙම තණ බිම්වල පස, ශාකවල ස්වභාවය ආදිය කෙබඳු වේද?

**41.** සැවානා බිම්වල දක්නට ලැබෙන තෘණ වර්ග හා ශාක වර්ග මොනවාද?

**42.** සැවානා තණබිම්වලට ඇති මානව බලපෑම් මොනවාද?

**43.** ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන පතන ආකාර 2 මොනවාද?

**44.** එම පතන ආකාර දෙකෙහි උෂ්ණත්ව පරාසයන්, වර්ෂාපතනය, පිහිටීම, පාරිසරික ලක්ෂණ, හමුවන තෘණ වර්ග, හමුවන ප්‍රදේශ, ජීවත්වන සත්ත්ව ආකාර ආදිය සඳහන් කරන්න.

GAURI ANUPAMA

**45.** තෙත් බිම් යනු මොනවාද?

**46.** රැම්සාර් සම්මුතියට අනුව  තෙත් බිම් අර්ථදක්වන්න.

**47.** රැම්සාර් අර්ථ දැක්වීමට අනුව ශ්‍රී ලංකාවේ තෙත්බිම් බෙදා ඇති කාණ්ඩ 3 මොනවාද?

**48.** එම එක් එක් කාණ්ඩයට උදාහරණ සධහන් කරන්න.

**49.** ශ්‍රී ලංකාවේ පවතින ගංගා ජාලය ගංගා කීයකින් පමණ සමන්විත වේද?

**50.** ශ්‍රී ලංකාවේ ජලාශ හා වැව් ආශ්‍රිතව දැකිය හැකි ජලජ පැළෑටි වර්ග මොනවාද?

**51.** මෙම වැව් වල දැකිය හැකි නිදහසේ පාවෙන ආක්‍රමණික ආගන්තුක ශාක විශේෂ මොනවාද?

**52.** අභ්‍යන්තර මිරිදිය වගුරු බිම් යනු මොනවාද?

**53.** එම වගුරු බිම් වල ලක්ෂණ සඳහන් කරන්න.

**54.** අභ්‍යන්තර තෙත් බිම්වල සුලභව හමුවන ශාක විශේෂ මොනවාද?

**55.** වගුරු වනාන්තරයකට උදාහරණයක් දෙන්න.

**56.** ශ්‍රී ලංකාව තුල විල්ලු දක්නට ලැබෙන ප්‍රදේශ නම් කරන්න.

**57.** එම විල්ලු ප්‍රදේශවල සුලභව වැවෙන වෘ ක්ෂ්කලතාදිය මොනවාද?

**58.** කලපුවක් යනු කෙබඳු භූමියක්ද?

**59.** උදාහරණ දෙන්න.

**60.** ගංමෝය දක්නට ඇත්තේ කවර ස්ථානවලද?

**61.** කඩොලාන පරිසර පද්ධති යනු මොනවාද?

**62.** කඩොලාන පරිසර පද්ධති වල ලාක්ෂණික ලක්ෂණ සඳහන් කරන්න.

GAURI ANUPAMA

**63.** ලවන වගුරුවල ප්‍රධාන ලක්ෂණ මොනවාද?

**64.** ලවන වගුරු දක්නට ලැබෙන ප්‍රදේශ මොනවාද?

**65.** කඩොලාන තම පරිසරයේ වඩාත් හොඳින් පැවතීම සඳහා දරන අනුවර්තන මොනවාද?

**66.** සුලභ සත්‍ය කඩොලාන හා කඩොලාන ආශ්‍රිත ශාක විශේෂ නම් කරන්න.

**67.** කඩොලාන සුලභව හමුවන ප්‍රදේශ මොනවාද?

**68.** කඩොලානවල පාරිසරික වැදගත්කම් මොනවාද?

**69.** මුහුදු තෘණ පැතිරී ඇත්තේ කවර ආකාරයේ පරිසරවලද?

**70.** මුහුදු තෘණ වල පාරිසරික වැදගත්කම කුමක්ද?

**71.** මුහුදු වැසි වනාන්තර ලෙස සැලකෙන්නේ කවර පරිසර පද්ධතිද?

**72.** කොරල් පරිසර පද්ධතිවල වැදගත්කම් සඳහන් කරන්න.

**73.** ශ්‍රීලංකාවේ කොරල් පරිසරපද්ධති දක්නට ලැබෙන මුහුදු ප්‍රදේශ මොනවාද?

**74.** ශ්‍රීලංකාවේ වඩාත්ම සුලභ මුහුදුවෙරළ ආකාරය වන්නේ ?

**75.** මුහුදුවෙරළ ප්‍රදේශවලට පොදු ලක්ෂණ මොනවාද?

**76.** මුහුදුවෙරළ ශාකවලට උදාහරණ දෙන්න.

**77.** වැලිකඳු යනු මොනවාද?

**78.** වැලිකඳුවල ලාක්ෂණික සඳහන් කරන්න.

**79.** වැලිකඳු හමුවන ප්‍රදේශ නම් කරන්න.

**80.** වැලිකඳුවල ව්‍යුහය තීරණය වීමට හේතුවන සාධක මොනවාද?

GAURI ANUPAMA

## සටහන

→ වනාන්තර

- පහත රට වර්ෂා වනාන්තර (නිවර්තන තෙත් පහතරට වැසි වනාන්තර)
- වියළි මෝසම් වනාන්තර (නිවර්තන වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර)
- කඳුකර වනාන්තර (නිවර්තන කඳුකර වනාන්තර)
- කටු පඳුරු (නිවර්තන කටු කැලෑ)

## පහත රට වර්ෂා වනාන්තර (නිවර්තන තෙත් පහතරට වැසි වනාන්තර)



ANUPAMA

## හමුවන ශාක විශේෂ

### හොර *Dypterocarpus zeylanicus*




### නා *Mesua ferrea*

### හල් *Vateria copallifera*

## හමුවන සත්ත්ව විශේෂ

වත දම් වඳුරා **purple face langur**

ශ්‍රී ලංකා උනහපුලුවා **Slender loris**

රන් හෝතඹුවා **Golden wet zone palm civet**

## <u>වියළි මෝසම් වනාන්තර (නිවර්තන වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර)</u>

GAURI ANUPA

## හමුවන ශාක විශේෂ

### වීර *Drypetes sepiari*

### පලු *Manilkara hexandra*

GAURANUJP

## කලුවර *Diospyros ebenum*

## හමුවන සත්ත්ව විශේෂ

වළසා

අලියා

## නිවර්තන කඳුකර වනාන්තර

### හමුවන ශාක විශේෂ

### කීන *Callophyllum walkeri*

වල් කුරුඳු ***Cinnamomum ovalifolium***

ගල් වෙරලු ***Elaeocarpus montanus***

හමුවන සත්ත්ව විශේෂ

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා පීත කණ් කොන්ඩයා | ශ්‍රීලංකා උස්බිම් හික්මියා | ගෝනා |
| **Sri Lanka yellow eared bulbul** | **Sri Lanka highland shrew** | **sambar** |

GAURI ANUPAMA

## කටු පඳුරු (නිවර්තන කටු කැලෑ)

### හමුවන ශාක විශේෂ

ගිනි අන්දර

රණවරා

හීරැස්ස

### හමුවන සත්ත්ව විශේෂ

මුවා

දිවියා

අලියා

**සැවානා**

## හමුවන ගස් වර්ග

### අරළු

### නෙල්ලි

### බුළු

## තෘණ වර්ග

### මාන

***Cymbopogon***

### ඉළුක්

***Imperata***

GAURI

## පතන

## තෙත් පතන

ටසොක් තණ

***Chrysopogon***

***Arundinella***

හමුවන සත්ත්ව විශේෂ

ගෝනා

වල් ඌරා

දිවියා

## වියළි පතන

**හමුවන තෘණ වර්ග**

**පැහිරි මාන**

***Cymbopogon***

**පිනිබර තණ**

***Themeda***

## තෘණ වර්ග

මාන ඉළුක්

පතන

තෙත් පතන

ටසොක් තණ

වියළි පතන

පැඟිරි මාන

පිනිබර තණ

GAURI ANUPAMA

## ජෛව විවිධත්වය (නිපුණතා මට්ටම 8.3)

**81.** ජෛව විවිධත්වය අර්ථ දක්වන්න.

**82.** ජෛව විවිධත්වය බෙදා දැක්විය හැකි මට්ටම් 3 මොනවාද?

**83.** එම එක් එක් සංරචක පැහැදිලි කරන්න.

**84.** ජෛවීය සම්පත් යනු මොනවාද? උදාහරණ ලබා දෙන්න.

**85.** ජෛව විවිධත්ව නිශ්පාදන අතරින් වාණිජමය හා වාණිජමය නොවන් නිශ්පාදන සඳහා උදාහරණ දෙන්න.

**86.** මානව සංහතියට හා පාරිසරික පැවැත්මට අදාළව ජෛව විවිධත්වයේ වටිනාකම් සඳහන් කරන්න.

**87.** ඉහත ඔබ නම් කළ එක් එක් වටිනාකම් සඳහා උදාහරණ ලබා දෙන්න.

**88.** පෘ ථිවිය මත සිදුවූ අවසාන මහා නෂ්ට වීම සිදු වූයේ මීට කොපමන කලකට පෙරද? එය සිදු වූයේ කුමන හේතුවක් නිසාද?

**89.** වර්තනමානයේදී නෂ්ටවීමේ සීඝ්‍රතාව පැවතිය යුතු මට්ටමට වඩා දහස්වාරයක් පමණ වේගවත් වීමට හේතු මොනවාද?

**90.** ජෛව විවිධත්වය මුහුණපා ඇති විවිධ තර්ජන මොනවාද?

**91.** එම ඉහත නම් කළ හේතු ජෛව විවිධත්වය බිඳ වැටීමට බලපාන ආකාරයන් පැහැදිලි කරන්න.

**92.** ආක්‍රමණික ආගන්තුක විශේෂ යනු මොනවාද?

**93.** එම විශේෂ මඟින් දේශීය විශේෂ කෙරෙහි ඇතිකරන බලපෑම කෙබඳු වේද?

**94.** ජෛව විවිධත්වයට බලපාන ප්‍රබලම දීර්ඝ කාලීන බලපෑම කුමක්ද?

**95.** ජෛව විවිධත්ව උණුසුම් කලාප යනු මොනවාද?

GAURI ANUPAMA

## සටහන

→ ඉහළම මට්ටමේ ජෛව විවිධත්වය වන්නේ පරිසර පද්ධති විවිධත්වයයි.

→ පරිසර පද්ධතියක් තුල,

- විශේෂ විවිධත්වය හා
- ප්‍රවේණි විවිධත්වය යන දෙකම හඳුනා ගත හැකියි.

→ ශාක හා සත්ත්ව විශේෂ මිය යමින් ඉවත්වීම සෑම විටම සිදුවන්නකි. නමුත් පෘථිවිය මත සිදුවන සියලු ක්‍රියාවලි මානව බලපෑම නිසා නොසිතුවිරූ ලෙස වෙනස් වී ඇත.

## ජෛව විවිධත්වයේ වටිනාකම්

→ පාරිසරික සේවා වටිනාකම

→ විනෝදාත්මක වටිනාකම

→ ආචාරධර්ම වටිනාකම

→ අධ්‍යාපනික/ විද්‍යාත්මක වටිනාකම

→ සමාජ/සංස්කෘතික/ ආගමික වටිනාකම

→ පාරිසරික සේවාවටිනාකම

AURI ANUPAMA




පෝෂණ චක්‍ර පවත්වාගැනීම




ප්‍රභාසංස්ලේෂණය






පස සෑදීම

ජල චක්‍රය පවත්වාගැනීම

බාදනයෙන් ආරක්ෂා වීම

පරාගනය

GAURI APA

→ විනෝදාත්මක වටිනාකම

ඡායාරූප ශිල්පය

පක්ෂීන් නැරඹීම

චිත්‍ර ඇඳීම

කාව්‍ය නිර්මාණය

නර්තනය

උද්භිද උද්‍යාන

→ ආචාරධර්ම වටිනාකම (මේ ග්‍රහලෝකය මත ජීවත් වීම සියලු ජීවීන් සතු අයිතියකි.)

→ අධ්‍යාපනික/ විද්‍යාත්මක වටිනාකම

නව විද්‍යාත්මක සොයා ගැනීම් සහ තාක්ෂණික නවීකරණය

→ සමාජ/සංස්කෘතික/ ආගමික වටිනාකම

පූජනීයත්වයෙන්සැලකෙන ශාක

පූජනීයත්වයෙන් සැලකෙන සතුන්

## ජෛව විවිධත්වය මුහුණ පා ඇති තර්ජන

→ වාසස්ථාන අහිමි වීම/ ඒවා කැඩී බිඳී යාම

→ අධි පරිභෝජනය

→ පරිසර දූෂණය

→ ආක්‍රමණික ආගන්තුක විශේෂ හඳුන්වාදීම

→ දේශගුණ විපර්යාස

→ වාසස්ථාන අහිමි වීම/ ඒවා කැඩී බිඳී යාම

කෘෂිකර්මාන්තය

වන විනාශය

තෙත් බිම් ගොඩ කිරීම හා ඉදිකිරීම්

→ පරිසර දූෂණය

ජල දූෂණය

වායු දූෂණය

පාංශු දූෂණය

සුපෝෂණය

→ ආක්‍රමණික ආගන්තුක විශේෂ හඳුන්වාදීම

*Lantana camara*

*Panicum maximum*

→ දේශගුණික විපර්යාස

දරුණු නියං තත්ත්ව වැඩිවීම

ග්ලැසියර දියවීම හා මුහුදු මට්ටම ඉහළ යෑම

ප්‍රාදේශීය ජල ගැලීම්

→ දරුණු නියං තත්ත්ව වැඩිවීම

→ උෂ්ණත්වය වැඩිවීම සහ ආන්තික උෂ්ණත්වය

→ මුහුදු මට්ටම ඉහළ යෑම

→ ප්‍රාදේශීය ජල ගැලීම්

→ වර්ෂාපතනය අඩුවීම

→ ප්‍රාදේශීය ජල ගැලීම්

→ මුහුදු මට්ටම ඉහළ යෑම

## ජෛව විවිධත්තව උණුසුම් කලාප




ඒක දේශීය විශේෂ වලඅධික සාන්ද්‍රණයක් සහිත වීම සහ ඒවාට අධික තර්ජනයක් සහිත ප්‍රදේශ ජෛව විවිධත්ව උණුසුම් කලාප නම් වේ. ලංකාවේ බටහිර කොටස හා ඉන්දියාවේ බටහිර කඳුකර ප්‍රදේශ එක්ව ගත් කල දකුණු ආසියාවේ ප්‍රධාන ජෛව විවිධත්ව උණුසුම් කලාපයකි.

GAURI ANUPAMA